## පළමුවන දේව ප්‍රකාශනය

ජෝබ් 7:1-4, 6-7

ජෝබ් තුමන්ගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**( මුළු දවස පුරාම මම දුකින් පිරී සිටිමි.)**

"මිහි මත මිනිස් ජීවිතය සටනක් නොවන්නේ ද? එය දවසේ කුලියට වැඩ කරන කුලීකරුවෙකුගේ දිවිය මෙන් නොවේද? තුරු සෙවනෙහි විවේකය සොයන වහලෙකු මෙන් ද වැටුප ගෙවන තුරු බලා හිඳින කුලීකරුවෙකු මෙන් ද මසින් මසට පාළු සිතින් කල් යැවීමට මට නියම ව ඇත. රැයින් රැය මම දුකින් දුකට පත් වන්නෙමි. මම නින්දට යන කල, 'රැය ගෙවී කොයි වේලේ නැගිටිම් ද' යි කියා ගනිමි. පහන් වන තුරු ඒ මේ අත පෙරළෙමින් සිටින්නෙමි. බලාපොරොත්තු රහිත ව මම දවස් යවමි. ඒවා නූල් කටින නඩාව මෙන් යුහුව දුව යයි." දෙවි සමිඳුනි, මාගේ දිවිය සුළං රොදක් පමණක් බව සිහි කරන්න. වාසනාව මින් මතු මා නොදකිනු ඇත.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 147:1-6

ඔබගේ පිළිතුර: සමිඳාණෝ බිඳුණු සිත් සුව කරන සේක.

ගීය: සමිඳුන්ට ප්‍රශංසා කරන්න. අපේ දෙවිඳුන් හට පසස් ගී ගැයීම යහපත්ය. එතුමන් පැසසීම පියකරු ය. හොබනේ ය. සමිඳාණෝ ජෙරුසලම ගොඩනගන සේක. විප්‍රවාසී වූ ඉශ්රායෙල් සෙනග රැස් කරන සේක.

එතුමාණෝ බිඳුණු සිත් ඇත්තන් සුව කරන සේක. ඔවුන්ගේ තුවාල බඳින සේක. එතුමාණෝ තාරකාවන් එකින් එක ගණන් කරන සේක. ඒ සියල්ලට නම් තබන සේක.

අප සමිඳාණෝ උතුම් ය. ඉතා බලසම්පන්න ය. එතුමන්ගේ ඥානය අසීමිත ය. සමිඳාණෝ දීනයන් ඔසවන සේක. දුදනන් පහතට හෙළන සේක.

## දෙවන දේව ප්‍රකාශනය

1කොරින්ති 9:16-19, 22-23

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**(මම සුභාරංචිය දේශනා නොකරම් නම් දඬුවමට සුදුසුසකු වන්නෙමි.)**

මා සුබ අස්න දේශනා කරන නමුත්, එය පාරට්ටු කර ගැනීමට කාරණයක් නොවේ. මන්ද, සුබ අස්න දේශනා කිරීමට මම බැඳී සිටිමි. සුබ අස්න දේශනා නොකළොත් මම මහා කාලකණ්ණියෙක් වෙමි. මාගේ ම කැමැත්තෙන් මම සුබ අස්න දේශනා කරම් නම්, වැටුපක් ලබා ගැනීමේ අයිතියක් මට ඇත. එහෙත් මම මගේ කැමැත්ත නොතකා, එම සේවය කරම් නම්, මම එසේ කරන්නේ දෙවියන් වහන්සේ මට පැවරූ කාර්යයක් ලෙස ය. එසේ නම් මාගේ වැටුප කුමක් ද? ඒ වැටුප නම් අය කිරීමක් නැතිව, සුබ අස්නේ සේවය වෙනුවෙන් වැටුපක් ලැබීමේ අයිතිය පැහැර හැර, සුබ අස්න දේශනා කිරීමයි. මම සියල්ලන් අතර නිවහල් තැනැත්තෙක් වුවත් බොහෝ දෙනෙකු දිනා ගන්නා පිණිස සියල්ලන්ගේ වහලෙක් වීමි. දුර්වලයන් දිනා ගන්නා පිණිස මම දුර්වලයන්ට දුර්වලයෙක් වීමි. කෙසේ හෝ වේවා ටික දෙනෙකු වුවත් දිනා ගන්නා පිණිස, මම සියල්ලෙහි දී ඒ ඒ තැනට ඔබින ලෙස ක්‍රියා

කළෙමි. මා මේ සියල්ල කරන්නේ, සුබ අස්න උදෙසා එහි ආශිර්වාදවලට හවුල්කාරයකු වන පිණිස ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තුති වේවා.

## සුපුවත් ජය නද

එපීසි 1:17-18

ආලේලූයා! ආලේලූයා!
තේජසේ පියාණන් වූ අපගේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දෙවියන් වහන්සේ, උන්වහන්සේ අවබෝධ කර ගැනීම පිණිස ප්‍රඥාව හා විදර්ශන ශක්තිය ඔබට දෙන මෙන් මම යාච්ඤා කරමි.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 1:29-39

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**(ජේසුස් වහන්සේ විවිධ රෝග වලින් පෙළුණු බොහෝ අය සුවපත් කළ සේක.)**

ඔව්හු ධර්මශාලාවෙන් නික්ම ආ කෙණෙහි ම, ජාකොබ් ද ජුවාම් ද කැටුව, සීමොන්ගේ හා ඇන්ඩෘගේ ගෙදරට පැමිණියහ. සීමොන්ගේ භාර්යාවගේ මව උණෙන් ඔත්පළ ව සිටියා ය. ඔව්හු වහා ම ඇය ගැන උන් වහන්සේට දැන්වූ හ. උන් වහන්සේ ඇය වෙතට ගොස් ඇගේ අතින් අල්ලා ඇය නැඟිටෙවූ සේක. ඇගේ උණ බැස ගියේ ය. ඈ නැඟිට ඔවුන්ට උපස්ථාන කළා ය. සවස හිරු බැස ගිය පසු සියලු රෝගීන් ද දුෂ්ටාත්මාවේශ වූ අය ද උන් වහන්සේ වෙත ගෙනෙනු ලැබූහ. නුවර වැසි මුළු ජනතාව දොරකඩ එක්රැස් වූ හ. උන් වහන්සේ විවිධ රෝග වලින් පෙළුණු බොහෝ අය සුව කළ සේක. බොහෝ දුෂ්ටාත්මයන් ද දුරු කළ සේක. තමා කවරෙක් දැ යි ඒ දුෂ්ටාත්මයන් දැන සිටි බැවින් උන් වහන්සේ ඔවුන්ට කතා කිරීමට ඉඩ නුදුන් සේක. හිරු උදාවට බොහෝ කලින් උන් වහන්සේ අවදි ව හුදකලා තැනකට ගොස් එහි යාච්ඤා කළ සේක. සීමොන් සහ ඔහුගේ සහායකයෝ උන් වහන්සේ සොයා ගොස්, සම්මුඛ වී, "හැම දෙන ම ඔබ සොයති" යි පැවසූ හ. උන් වහන්සේ උත්තර දෙමින්, "අන් තැන්වලත් දේශනා කරන පිණිස අපි අවට නුවරවලටත් යමු; මා ආයේ ඒ සඳහා ය" යි වදාළ සේක. උන් වහන්සේ ඔවුන්ගේ ධර්මශාලාවල උගන්වමින් ද දුෂ්ටාත්මයන් දුරු කරමින් ද ගලීලය පුරා සැරිසැරූ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.